පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 11 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- සිංහල භාෂාව හා සාහිත්‍යය - I , II

පාසලේ නම : ........................................................................................

ඇතුළත්වීමේ අංකය : ...............................

කාලය ;පැය 03

## I පත්‍රය

***සැලකිය යුතුයි***

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 40ක් ලැබේ.**
- **අංක 1-40 තෙක් ප්‍රශ්නවලදී (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ උත්තරය තෝරන්න.**

---

1) තමා **දිව දෙකේ** මිනිසෙකු නොවන බව සිරිදාස පැවසුවේ ය.

(1) දිව දෙකක් ඇති (2) කරදරකාරී නොවන
(3) ස්ථිර ප්‍රතිපත්තියක් නැති (4) අකාර්යක්ෂම

2) **හීන් නූලෙන්** සියලු කාර්යන් සැලසුම් කිරීමට තාත්තා දක්ෂයෙකි.

(1) කපටිකමෙන් (2) සූක්ෂම අයුරින්
(3) ඉක්මණින් (4) නූලක ආධාරයෙන්

3) **වැල්වටාරම්වලින් තොරව** කතාව ඉදිරිපත් කිරීම සුදුසු බව විදුහල්පතිතුමා ශිෂ්‍යයාට පැවසීය.

(1) අනවශ්‍ය කරුණු රහිතව (2) වැලක් ආකාරයෙන්
(3) දීර්ඝ විස්තර සහිතව (4) වහසි බස් සහිතව

- **අංක 4 සිට 6 තෙක් ප්‍රශ්නවල හිස් තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.**

4) පෘථිවියට අලංකාරය ලැබී ඇත්තේ එහි ..................................... වැඩි කොටසක් ජලයෙන් වැසී ඇති නිසයි.

(1) පතුළ (2) අභ්‍යන්තරයේ (3) මධ්‍යයේ (4)පෘෂ්ඨයෙන්

5) 1950 දශකයේ නිම වූ එම ගොඩනැගිලි දේශීය වාස්තු විද්‍යාත්මක .............................. ලොවට හඬගා පැවසීය.

(1) හැඩය (2) සංයමය (3) අනන්‍යතාවය (4) අභිවෘද්ධිය

6) භාෂාවේ විවිධතා හැදෑරීම මානව සමාජයේ ............................ හේතුවන ප්‍රධාන කරුණකි.

(1) චින්තනයට (2) උන්නතියට (3) පරිහානියට (4) මතභේදයට

7) අකාරාදී පිළිවෙළ නිවැරදිව දැක්වෙන පද පේළිය තෝරන්න.

(1) අඟුළ , ආකාශ,අග්නි, අගිල් .අගාධ
(2) අත්තා,මුත්තා,නත්තා,පනත්තා,කිත්තා
(3) අමාවතුර, බුත්සරණ ,පූජාවලිය, කව්සිළුමිණ, ධර්මප්‍රදීපිකාව
(4) කඩවත, දඹදෙණිය ,දිඹුලාගල , බටපොළ, වෙහෙරගල

---

(8) සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදි පද පේළිය තෝරන්න.

(1) අත්‍යවශ්‍ය,ප්‍රාසංගික,කොට්ඨාස,ක්ෂෝභ (2) නීත්‍යානුකූල, අර්ධය,ක්‍රෝදය,සූර්යයා
(3) ප්‍රකෘති,කර්තෘ, සම්ප්‍රධාය,මාතෘකාව (4) වෛරය,වෛවර්ණ,මෛත්‍රි, ඓෙතිහාසික

(9) උක්ත පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ක්‍රීඩකයෝ, මහත්වරුන්,දක්ෂයෝ,අම්මාවරු
(2) ප්‍රේතයෝ,කිරිල්ලියක,වදුරෝ, බ්‍රාහ්මණයෝ
(3) ඔවුහු ,ගායකයෝ,අපි, වහල්ලු,කුරුල්ලෝ
(4) කාන්තාවක,පිරිමියෙක්,වහන්සේලා,සිසුන්

(10) **පහත දැක්වෙන පද පේළිවල දෙවන අක්ෂරයෙහි පිළිවෙළින් කෙටි ඇදය, ඇලපිල්ල,කෙටි ඉස්පිල්ල, දීර්ඝ පාපිල්ල යෙදී ඇති වරණය සොයන්න**

(1) කරුව, අකාරුණික,සීදුව,සදූප (2) අඩුව,මනුව,පේලිය,බූරුවා
(3) අතැඹුල, ගුණාංග , ගිනියම ,අභූත (4) මිහිරි,මාරුව, මරුවා, ස්තූපය

(11) නිවැරදිව විසන්ධි කර ඇති පද පමණක් ඇති වරණය තෝරන්න.

(1) පත්+තිරු ,ගොක්+අත්ත, මුත්ත+ආ ,මල්+අත්ත
(2) පංච+ඉන්ද්‍රිය, ප්‍රීත් + උත්සවය ,අති+උදාර,බත්+අල
(3) ඉන්+අල,බාල +අංශය,ඇඟිලි+එන්,විද්‍යා+අනුකූල
(4) වන+ඖෂධ, අමාත්‍ය+අංශය, පත්+ඉරු, සුදුසු+ඕ

(12) ගුරුතුමිය සමිතගේ පොතේ **රතු පෑනෙන්** තරුවක් ඇන්දාය මෙහි රතු පෑනෙන් යන්න,

(1) අවධි විභක්තියට අයත් වේ. (2) කරණ විභක්තියට අයත් වේ.
(3) කර්ම විභක්තියට අයත් වේ. (4) සම්ප්‍රදාන විභක්තියට අයත් වේ.

(13) ඇය දුටු අසිරිමත් දර්ශනය පැමිණි සියල්ලන්ට ම විස්තර කළා ය. මෙහි අසිරිමත් යන පදය,

(1) තද්ධිත පදයකි (2) සමාස පදයකි. (3) කෘදන්ත පදයකි. (4) සන්ධි පදයකි.

■ **අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.**

(14) **උදක පාරිශුද්ධිය** නිසා බ්‍රහ්ම සහව්‍යතාවයට පත්වන බව බමුණෝ විශ්වාස කළ හ.

(1) ජල පරිභෝජනය (2) ජලයෙන් වන පිරිසිදු බව
(3) ගින්නෙන් දැවීම (4) උදෑසන පවිත්‍රතාවය

(15) භාෂාව හා සංස්කෘතිය අතර ඇත්තේ **අවියෝජනීය** සබඳතාවයකි.

(1) අවස්ථාවෝචිත (2) අවිචාරශීලී
(3) වෙන්කළ නොහැකි (4) අවිද්‍යාත්මක

(16) ස්වභාවික **ව්‍යසන** අවම කර ගැනීම අතිශය වැදගත්ය.

(1) වාසස්ථාන (2) විපත් (3) ව්‍යවහාර (4) ව්‍යාපාද

(17) එක් එක් වරණයේ මුල ඇති පදයට සමාන අර්ථ දෙන පද පමණක් ඇති වරණය තෝරන්න.

(1) සඳ - චන්ද්‍රයා,සිසි, දිනිඳු,සොමි (2) නෙලුම - පංකජ,කුසුම,කමළ,සියපත

(3) ඉදුදුනු -ඉදුසැව් ,ඉන්ද්‍රචාප,දේදුන්න,ඉදුවර (4) රවි - රිවි,දිනකර,දිනමිණ ,සූර්යයා

(18) ධාතු ප්‍රකෘතියකට ප්‍රත්‍යක් එක් වීමෙන් සෑදෙනුයේ,

(1) සමාස (2) තද්ධිත (3) කෘදන්ත (4) උපසර්ග

(19) "සඳ හා කැටුව නික්මුණු නකත් තරුවක් මෙන්" මෙම වාක්‍යයහි සඳහන් කැටුව යන පදය අයත් වන්නේ,

(1) කෘදන්ත (2) නිපාත පද (3) නාම පද (4) උපසර්ග

(20) විරුද්ධ පද නිවැරදි ලෙස ගලපා ඇති වරණය තෝරන්න.

(1) සාමාන්‍ය -අසාමාන්‍ය ,උත්තම-අධම ,ප්‍රතිභා පූර්ණ-ප්‍රතිභාහීන

(2) ආගන්තුක - නේවාසික, භාග්‍ය-අභාග්‍ය ,සම්මත-අසම්මත

(3) දුලබ - ප්‍රබල , පැලදිග-පැදුම්දිග , පූර්ව -අපර

(4) ස්වාධීන -යාවජීව , ව්‍යාජ- අව්‍යාජ , බාහිර- අභ්‍යන්තර

(21) උපසර්ග පද පමණක් ඇති වරණය තෝරන්න.

(1) ප්‍රබල,දුර්මත,සංවර්ධනය,අබිමත (2) උපදේශක,හෙවත්,පරපුටු,අවබෝධය

(3) සබඳ,උපනෙත,සරසවි,නිදුක් (4) දුහද, විදේශ,තිනෙත්,මහෝදර

(22) මිශ්‍ර ක්‍රියා පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) සරෝජා පැමිණ නාම ලේඛනය රැගෙන ගියා ය

(2) සරස්වතී නාදන් ලවා කැවිලි ගෙන්වා ගනියි.

(3) නංගී මහමග සිනාසෙමින් ගමන් කරයි.

(4) සිරිදාස පැමිණියහොත් මම එතැනින් ඉවත් වෙමි.

(23) අර්ධ ස්වරයක් නොයෙදුණ වචනයක් සහිත වරණය තෝරන්න.

(1) රුවල, වෛරය, සතුට, වලව්ව (2) වරාය, රාවය, වහර, හවරිය

(3) වේලාව, වීරයා, ධීවරයා, විරල (4) වීරිය, වාරුව , විරිත, වරාය

(24) මුලින් දී ඇති ඇති පදය හා නො ගැලපෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) සන්ධි - අභ්‍යවකාශය, චූලෝදර,පිනැති,තිනෙත්

(2) සමාස -වනමල් ,කිරිබත්, බුදුබණ ,ප්‍රබල

(3) යුගල පද -තැගිබෝග, අවිආයුධ, ගනුදෙනු , ලේසි පහසු

(4) කෘදන්ත - නටන, කියුම් ,කරන්නා, බැලුම්

(25) දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නිවැරදි නගරනාමය තෝරන්න

(1) චනොකිච්ලිය (2) ගහකදස්ලියටගි

(3) නව්රතාහොප (4) කත්ක්අපරෙයිවතු

■ **අංක 26 සිට 28 දක්වා දී ඇති අදහසට වඩාත් ගැලපෙන ප්‍රස්තාව පිරුළ හෝ රූඪිය තෝරන්න.**

(26) කොතෙක් වෙහෙස වුව ද අවසානයේ කිසිදු ප්‍රතිඵලයක් අත් නොවීම.

(1) වක්කඩේ හකුරු හැංගුවා වගෙයි. (2) දොඩම් ගොඩ බදාගත්තා වගේ.

(3) එළිපත්ත උඩ ඉන්න බළලා වගේ. (4) කළුවා මාරපන ගියා වගේ.

(27) උදව්වක් කර යමක් බලාපොරොත්තු වීම.

(1) කපන්න බැරි අත ඉබිනවා වගේ . (2) දී කිරට බළලුත් සාක්කිලු.

(3) අත දීලා දත නියවන්නා වගේ. (4) ඉබ්බාගෙන් පිහිටා ඉල්ලුවා වගෙයි.

(28) යථාර්ථය යටපත් වී ඇති බව,

(1) අකුල් හෙළනවා (2) ඇස් අන්ධ වෙලා

(3) හෙනහුරා ලබලා (4) කොළේ වහනවා

■ **අංක 29-30 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.**

(29) (1) අක්කා යෙහෙළික සමඟ පාඩම් කළා ය. (2) ගුරුවරුන්ද ශිෂ්‍යයෝ ද රැස්වීමට ආහ.

(3) මම විභාගය සමත් වෙතියි අම්මා සිතුවා ය. (4) දෙමාපියන් එයට සම්බන්ධ නැත.

(30) (1) මිතුරන් විසින් සතුන් ආරක්ෂා කෙරෙති.

(2) අධ්‍යක්ෂ මණ්ඩලයේ කාන්තාවන් ද ඇත.

(3) දේශප්‍රේමීන් දේශය ආරක්ෂා කළහ.

(4) ඔහු දෙවියකු වැනි මිනිසෙකි.

(31) **ගොවිහු බුදුන්** වෙනුවෙන් පූජා කිරීම සඳහා ශ්‍රී මහා බෝධිය **අසල** කිරි ආහාර පූජාවක් **පැවැත්වූ හ.**

ඉහත වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත පද හැඳින්වීම සඳහා යොදා ව්‍යාකරණනුකූල අංගවල අනුපිළිවෙළ නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න

A. අවසාන ක්‍රියා C. නිපාත පද

B. අනුක්ත පද D. උක්ත පද

(1) DBCA (2) ADBC

(3) CDAB (4) DABC

(32) "උන් එනවා කියලා අම්මා දැනගෙන ඉදලා නෑ"මෙම වාක්‍යය නිවැරදිව ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ,

(1) ඔවුන් පැමිණෙන බව මව දැන නොසිටියේ ය.

(2) ඔවුහු පැමිණෙන බව මව දැන නොසිටියා ය.

(3) ඔවුන් පැමිණෙන බව මව දැන නොසිටියා ය.

(4) ඔවුහු පැමිණෙන බව මව දැන නොසිටියහ.

(33) චතුර මල කෙටිකතාව රචනා කළ ලේඛකයා වන්නේ,

(1) මහගම සේකර (2) ඇරැව්වල නන්දිමිත්‍ර (3) කේ.ජයතිලක (4) ගී ද මෝපසන්

(34) පහත කවියෙහි තෙවැනි පදය නිවැරදිව දැක්වන වරණය තෝරන්න.

"වැහි පොද මගෙ හිමිගෙ හිසමත නො වැටේවා
මේ රුදු සුළං රැළි රළ පිට නොගැටේවා
.........................................................................................
ලන ඇම ගිළින තරමට උන් ළං වේවා"

(1) ගව්වෙන් ගව්ව දිව මාලිග සැදේවා (2) මුහුදේ නැගෙන දිය රැළි කඳ අඩුවේවා.

(3) සීතළ සුළං හිමි ගත මත නොගැටේවා. (4) පැද යන ඔරුව වෙත මසු කැල දැවටේවා.

(35) "බල යුත් තුමුල මත වරණිඳු මෙදෙනැවිස" මෙහි වරණිඳු යනුවෙන් සඳහන් වන්නේ,

(1) ශක්‍ර දෙවියා (2) හස්ථිරාජයා

(3) බුදුන් වහන්සේ (4) හංසයා

(36) රූපකාලංකාරයක් සහිත කවි පෙළ සහිත වරණය තෝරන්න.

(1) වැඳ රද පද කමළ (2) රූ රැසේ අඳිනා ලෙසේ

(3) පුරදර වන් බඹදත් නර පවරා (4) අසන රිසින් නයි කැල ඔසලෝයා

(37) උපදේශාත්මක කාව්‍ය ගණයට අයත් නොවන කෘතිය ඇතුළත් වරණය වන්නේ,

(1) සිරිත් මල්දම , ලෝකෝපකාරය, හිතෝපදේශය

(2) ගුත්තිල කාව්‍යය, සිරිත් මල්දම, ලෝවැඩ සඟරාව

(3) ලෝවැඩ සඟරාව , ලෝකෝපකාරය,සිරිත් මල්දම

(4) ලෝකෝපකාරය, සුභාෂිතය,ලෝවැඩ සඟරාව

(38) "එක්තරා බමුණෙක් කුඹුරෙහි සී සා ගොන් ගේ මුදා හැර නියර කොටන්න පටන් ගත්තේ ය." මෙහි ගොන් ගේ යනු,

(1) එළදෙන (2) වසු පැටියා (3) ගොන් බාන (4) ගොන්නු සිටින ගෙය

(39) "ළා සුළඟට සැලෙන ළපලු - ඇසට කනට ගීතයක්ය
මී දේ දුව ඉසට නැඟුව - ඉඳු නිල්මිණි සේසතක්ය"

මෙම කවියෙන් කියැවෙන්නේ,

(1) සේසතක් පිළිබඳවය. (2) ශ්‍රියා කාන්තාව ගැනය.

(3) ඇසළ ගසක් ගැනය (4) බෝ ගසක් ගැනය

(40) පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස ලබා දෙන පිළිතුර තෝරන්න.

මිනිසුන්ගේ ජීවනෝපාය මාර්ග මුල් කර ගනිමින්ද විවිධ සිරිත් විරිත් ඇදහිලි ආදිය නිර්මාණය වී ඇත. ඒවා අධ්‍යයනය කිරීමෙන් එකී සංස්කෘතිය පිළිබඳව දැන ගැනීමටත් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීමටත් හැකි වෙයි.

(1) මිනිසුන්ගේ ජීවනෝපාය මාර්ග විවිධ සිරිත් විරිත් ඇදහිලි මගින් නිර්මාණය වී ඇතත් ඒවා අධ්‍යයනයෙන් සංස්කෘතිය ඉගෙන ගත හැකිය.

(2) මිනිස් ජීවනෝපාය පාදකව නිර්මිත විවිධ සිරිත් විරිත් ඇදහිලි අධ්‍යයනයෙන් එම සංස්කෘතිය දැන සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනංවා ගත හැකි වෙයි.

(3) සංස්කෘතිය දැන ගැනීමට හා සහජීවනයෙන් හා ජාතිකාභිමානයෙන් ගොඩනැගීමට ජීවනෝපාය හා බැදුණු සිරිත් විරිත් දැන ගැනීම ඉගෙන ගැනීම වැදගත් වෙයි.

(4) සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනංවා ගැනීමට ජීවනෝපාය හා බැදුණු සංස්කෘතිය අධ්‍යයනය කිරීම වැදගත් වෙයි.

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 11 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- සිංහල භාෂාව හා සාහිත්‍යය - II

පාසලේ නම : ..........................................

ඇතුළත්වීමේ අංකය : ..........................  කාලය :

**II පත්‍රය**

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.**

- **i සිට x තෙක් ඇති සියලුම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

---

I. සිංහල හෝඩියේ ඇතුළත්

(අ) ඕෂ්ඨජ (ආ) වර්ගාන්ත

අක්ෂරය බැගින් ලියන්න

II. පහත පද නිවැරදිව සන්ධි කර සන්ධි වර්ගය නම් කරන්න.

(අ) දෙ+ අඟුල් (2) තුනු+අඟ

III. පහත වාක්‍යයේ ඇති තද්ධිත පදයක් හා කෘදන්ත පදයක් තෝරා ලියන්න.

සිඟිති දැරිය මොළකැටි අත් ලෙලවමින් ඉදිරිපත් කළ නැටුම කාගෙත් සිත් ගත්තේ ය.

(අ) (ආ)

IV. පහත වාක්‍යයේ ඇති වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිවැරදි කර ලියන්න.

භරත මුණිවරයා ඉදිරිපත් කරන්නට යෙදුනු රසවාදය කාව්‍ය විචාරය සඳහා මනා උපකරණයක් කර ගනු ලැබුයේ ආනන්දවර්ධන ආචාර්යයන් විසිනි.

(අ) (ආ)

V. පහත පදවලට විරුද්ධාර්ථ දෙන පද ලියන්න.

(අ) අනුගාමී

(ආ) ප්‍රසාරණය

VI. පහත දී ඇති වාක්‍ය සදොස් නම් නිදොස් කර නැවත ලියන්න.

(අ) ගොවියෝ සමඟ ගෙවිලියෝ ද කුඹුරු වපුරති.

(ආ) බඹරු දෂ්ඨ කරතියි අපි බිය වීමු.

VII. පහත සඳහන් වාක්‍යයේ ඇති සමාස පද දෙකක් ලියා එම සමාස පද අයත් සමාස වර්ගය නම් කරන්න.

" රකුසුවත ඇති අධම පුරුෂයා දුසිරිත්වල යෙදෙමින් පාපිෂ්ඨ දිවියක් ගත කළේ ය."

(අ)

(ආ)

VIII. තනි පදය ලියන්න.

(අ) රිදියෙන් කරන ලද

(ආ) ඉබේ පහළ වූ

IX. පහත දී ඇති කර්තෘ කාරක වාක්‍ය දෙක කර්ම කාරකයට හරවා ලියන්න.

(අ) විනිසුරුතුමා සැකකරුවන් නිදොස් කළේය.

(ආ) ඔවුහු නිකරුණේ අප වෙහෙසූහ.

X. පහත සඳහන් ප්‍රාදේශීය ව්‍යවහාරවල පොදු ව්‍යවහාරය ලියන්න.

(අ) කුදගහනවා

(ආ) පුන්නනවා

**2. පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතරින් එකක් තෝරාගෙන වචන 250කට නො අඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.**

(අ) යටත් විජිත පාලන සමයේ පැවති අධ්‍යාපන ක්‍රමයේ පැවති අඩු ලුහුඩුකම් අසමානතා හා අයුක්ති ඉවත් කරමින් සමාජ ආර්ථික ආගමික හා වාර්ගික ආදී කිසිදු භේදයකින් තොරව සෑම ළමයෙකුට ම සම අවස්ථා සැපයීම නිදහස් අධ්‍යාපනය හඳුන්වා දීමේ අරමුණු වූ අතර වර්තමානයේ නිදහස් අධ්‍යාපනය හා ඒ හා බැඳුණු ගැටලු රැසක් නිර්මාණය වී ඇති අයුරු පැහැදිලිව දැකගත හැකිය. නිදහස් අධ්‍යාපනයේ අනාගත මුහුණුවර කෙසේ වෙනස්වේද යන්න මේවන විට සැමට ගැටලුවකි.

(ආ) ජනගහනය අධික වීම මෙන් ම නියඟ හා ගංවතුර වැනි ස්වභාවික ආපදා හේතුවෙන් ආහාර අර්බුදයක්හට ගනිමින් තිබීම සමස්ත ලෝක ප්‍රජාවට ම මුහුණ දීමට සිදුව ඇති අභියෝගයකි. කෘෂි කර්මාන්තය අතහැර වෙනත් වෘත්තීන්වල නියැලීමට මිනිසුන් පෙළඹීම ද මේ තත්වය ඇතිවීමට බලපා ඇත. මේ සඳහා විධිමත් හා කඩිනම් විසඳුම් අවශ්‍යය.

(ඉ) ආනයනය කළ තිරිඟු පිටිවලින් සැකසුණ ආහාර පරිභෝජනයට ශ්‍රී ලාංකිකයන් නැඹුරුවීම බරපතල පෝෂණ හා සෞඛ්‍ය ගැටලු නිර්මාණය වීම හේතුවෙන් බෝ නොවන රෝග රැසක් සමාජයේ හිස ඔසවමින් පවතී. දේශීය සහල්, සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන ,අල බතලවලින් සකස් කළ ආහාර රටාවකට ජනතාව හැකි ඉක්මනින් යොමු වීම කාලීන අවශ්‍යතාවයක් බවට පත් වී ඇත.

(ඊ) සාහිත්‍යය ජනතා උරුමයකි.ඉන් රටේ සමාජීය, සංස්කෘතික හා දේශපාලනික තොරතුරු ද නිරූපණය වේ. පුද්ගලයා තුළ යහපත් ආකල්ප වර්ධනය සඳහා සාහිත්‍යය පාදක වෙයි. ඒ අනුව රටේ ජනතාවගේ සිතුම් පැතුම් යහමඟට පත්කර සාමකාමී පුරවැසි පිරිසක් බිහිකර ගැනීමට සාහිත්‍යය ඉවහල් කර ගත හැකිය.

(ලකුණු 25)

**(03) පහත දැක්වෙන ඡේදය වචන 55-65 අතර වන සේ සාරාංශ කර ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අවසානයේ ලියන්න.**

ජනශ්‍රැති යනුවෙන් අප විසින් හඳුන්වන ලබන ජන සම්ප්‍රදායන් සියල්ලෙන් ම මූලිකව ම සිදු කරනු ලැබ ඇත්තේ එක් පරම්පරාවක් විසින් ලබා ගන්නා ලද සමස්ත දැනුම් පද්ධතිය ඊළඟ පරම්පරාව සඳහා උරුම

කර දීමය. මේ දැනුම් සම්භාරය යනු එක අංශයක එක පැතිකඩක් පමණක් සම්බන්ධ වූ ඒවා නොවීය. එහෙයින් කුමන ජනශ්‍රැතියක් විශ්ලේෂණයට භාජනය කරනු ලැබුවත් යම් අංශයක් හා බැඳි දැනුම් ඒ වටා ගොනු වී ඇති බව දැකිය හැකිවනු ඇත.

මින්නේරිය වැව වේවා, කලා වැව වේවා, සොරබොර වැව වේවා, ආශ්‍රය කොටගත් ජනප්‍රවාද සලකා බැලූ කල්හී ඒවායෙහි විනිවිද දැකිය හැක්කේ පැරැන්නන් වැව් බැඳීම සඳහා යෝග්‍ය ස්ථාන නිශ්චිත කොට ගැනීමට පාදක කොට ගත් කරුණු ය. වැව් බැඳීම සඳහා යොදාගත් තාක්ෂණික ක්‍රමවේදය අනුගමනය කළ සිරිත් විරිත්ය. ඉටු කරන ලද පුද පිළිවෙත් ය. අනුරාධපුරය වේවා, පොලොන්නරුව වේවා, දඹදෙණිය වේවා, අගනුවර ඇසුරු කොටගත් ජනප්‍රවාද මගින් අපට ආරක්ෂා සහිත ජනශ්‍රැති රාජකීය අගනුවරක් ඉදි කිරීම සඳහා කරන ලද සැලසුම් හා උපයෝග කොටගත් ක්‍රමවේද පිළිබඳ අවබෝධයක් ද ලබා ගත හැකිය..

(ලකුණු 10)

**(4) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

රංගෝලි සිත්තම් නිර්මාණය මගින් බිම හා බිත්ති හැඩ කිරීම සඳහා හිංදු කාන්තාවෝ හාල්පිටි සුදු පැහැති ගල් කුඩු හෝ වර්ණවත් පාට හුණු උපයෝගී කර ගනිති. ඉන්පසු ධාන්‍ය,පබලු,මල් හෝ තවත් ද්‍රව්‍ය එම සැරසිලි සඳහා එක් කරති. වරකට මදක් වැටෙන සේ පිටි හෝ කුඩු ඉස රංගෝලි සිත්තමෙහි බාහිර රේඛාව සදා ගත් පසු මෝස්තරයක් නිමැවෙන සේ අනෙක් ද්‍රව්‍ය යොදා එම තිත් යා කෙරේ. සම්පූර්ණ සිත්තම් නොකැඩුණු ඉරිවලින් යුක්ත වීම ඉතා වැදගත් කොට සැලකෙන්නේ එවිට නරක ආත්මයන්ට හිඩැස් තුළින් ඇතුළුවීමට නොහැකිවේයැයි විශ්වාස කරන බැවිනි. බොහෝ රංගෝලි සැරසිලි අවුරුදු සිය ගණන් පැරණි පාරම්පරික ඒවා ය. කාලයේ අනන්ත ස්වභාවය සංකේතවත් කෙරෙන බැවින් රවුම් හැඩැති රංගෝලි සිත්තම් වඩා ජනප්‍රිය වන අතර රංගෝලි තේමාවන් සඳහා ඉර හඳ තාරකා ද ඇතුළත් වේ. ඇතැම් ප්‍රදේශවල කුරුල්ලන් අලි ඇතුන් මල් හා මිදි වැල් රූප ද රංගෝලි සැරසිලිවල දක්නට ලැබේ. නෙලුම් මල රංගෝලි සැරසිලිවල ප්‍රධාන තේමාවකි. එය සුන්දරත්වය සමෘද්ධිය හා සශ්‍රිකත්වය කියාපාන සංකේතයක් සේ පිළිගැනේ. හින්දුන්ගේ ප්‍රධාන දෙවඟනක් වන ලක්ෂ්මිය බොහෝ විට පෙනී සිටින්නී අතින් දරාගත් නෙලුමක් සහිත ව හෝ නෙලුම් මලක් මත වැඩ සිටිනා ස්වරූපයෙනි. එබැවින් ඇය දීපවාලි උත්සවයේ ඉතාම වැදගත් දෙවඟන වේ. ශ්‍රී ලක්ෂ්මිය අත් හතරක් සහිතව නිරූපිත ය. එක් එක් හස්තය මගින් ධර්ම ,කාම,අර්ථ,මෝක්ෂ යන ගුණාංග කියාපාන බව හිංදූන්ගේ විශ්වාසයයි.

(1) මෙම ඡේදයෙන් කියැවෙන්නේ කවර උත්සවයක් පිළිබඳවද?
(2) රංගෝලි සැරසිලි කිරීමට භාවිතයට ගන්නා ද්‍රව්‍ය මොනවාද?
(3) නෙලුම් මල රංගෝලි තේමාවක් ලෙස යොදා ගැනීමට හේතු මොනවාද?
(4) ලක්ෂ්මි දෙවඟනගේ අත් හතරින් කියැවෙන්නේ කවර ගුණාංගද?
(5) රවුම් හැඩැති රංගෝලි සිත්තම් ජනප්‍රිය වීමට හේතුව කුමක්ද?

(ලකුණු 10)

**(6) පහත විස්තරය පදනම් කරගෙන අත් පත්‍රිකාවක් සකස් කරන්න.මේ සඳහා වචන 100ක් පමණ යොදා ගැනීම ප්‍රමාණවත් ය.**

පුලස්තිපුර වීර උදාරගම පහන් තරු ක්‍රීඩා සමාජය සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් අඛණ්ඩව පවත්වන බක් මහ සැණකෙළිය මෙවරත් අප්‍රේල් මස 10 දින වීර උදාරගම පුබුදු ක්‍රීඩා පිටියේදී දවස පුරා

පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කර ඇත. පෙරවරු 8.00 සිට උළෙල ආරම්භ කිරීමට යෝජිත අතර සිංහල ජන ක්‍රීඩා තරග ,තිරික්කල රේස් ,අලි ධාවන තරග, ඔරු පැදීම,අවුරුදු කුමරිය තේරීම, ජන ගායනා ,විවිධ ඇඳුම් තරග ආදී ක්‍රීඩා ඉසව් රැසක් පැවැත්වීමට නියමිතය. තරගවාර අතර තුර ගමට අවුරුදු ඒම සංදර්ශනාත්මකව ඉදිරිපත් කිරීමට ග්‍රාමයේ කලායතන ශිල්පීහු සූදානම්ව සිටිති. මේ පිළිබඳව ප්‍රදේශවාසින් දැනුවත් කිරීම සඳහා ඔබ පහන්තරු ක්‍රීඩා සමාජයේ ලේකම් වන සහන් වීදාගම යැයි සිතා සුදුසු අත් පත්‍රිකාවක් නිර්මාණය කරන්න.

**නැතහොත්,**

2023 වර්ෂය සඳහා ඔබ පාසල මගින් සංවිධානය කරන ලද සාහිත්‍ය මාසය ඉලක්ක කර ගනිමින් සිදුකරනු ලැබූ " කියවමු දිනමු" කියවීමේ කඳවුර පිළිබඳව විස්තර ඇතුළත් පුවත් පත් වාර්තාවක් පිළියෙළ කරන්න.මෙහිදී වැඩසටහනේ අරමුණු හා වැඩසටහන් ඇතුළත් වන පරිදි වාර්තාව පිළියෙළ කරන්න.

(ලකුණු 15)

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 11

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- සිංහල භාෂාව හා සාහිත්‍යය - III

පාසලේ නම : ............................................................

ඇතුළත්වීමේ අංකය : ..............................          කාලය : පැය 02

## III පත්‍රය

වැදගත් : **උපදෙස් දී ඇතිදි පරිදි ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
**1,2,3.4 ප්‍රශ්නවලටත් 5,6,7.ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු ලියන්න.**
**මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.**

---

(01) **(I) සිට (X) තෙක් ඇති සියලුම ප්‍රශ්නවල අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න.කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

I. " ඉදින් නුඹ වහන්සේ අමුත්තක් දක්නා සේක් වී නම් පසිදුව මැනව"

(අ) ඉහත ප්‍රකාශය උපුටා ගත් ජාතක කතාව කුමක්ද?

(ආ) මෙම ප්‍රකාශය කළේ කවුද?

II. "වර වෙණ නද අසමින් සිත                    සතොසිනි
.................................................................
පුරඹර වසමින් සිටි රඟ                    කුම් වැනි
................................................................."

(අ) මෙම කවියේ ඉතිරි පද පේළි දෙක සම්පූර්ණ කරන්න

(ආ) මෙහි එන උපමාවක් ලියා දක්වන්න

III. "ආ එහෙමනම් අපට බෑ මෙහිදී මුකුත් කියන්ඩ"

(අ) ඉහත ප්‍රකාශය ඇතුළත් පාඩම කුමක්ද?

(ආ) එහි පරිවර්තකයා නම් කරන්න.

IV. (අ) අපට වැසිකිළියක් කෙටිකතාව ඇතුළත් කෙටිකතා සංග්‍රහය කුමක්ද?

(ආ) එම කෙටිකතාවේ  රචකයා නම් කරන්න.

V. "වහන්සේ දුගීමි බොහෝ දරු බිළිඳුන් ඇත්තෙමි මට දිවි දෙව"

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් ඇතුළත් ග්‍රන්ථය කුමක්ද?

(ආ) එය කුමන යුගයේ රචනා වූවක්ද?

VI. (අ) ලාංකීය සංදේශ සාහිත්‍යයේ හමුවන පැරණිතම සන්දේශ කාව්‍ය කුමක්ද?

(ආ) කෝට්ටේ යුගයේ රචිත සන්දේශ කාව්‍යයක් නම කරන්න.

VII. "දැන් ඉතිං තියෙන්නේ යාළුවාට ලියුමක් දාන්න"

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් කෙටිකතාව කුමක්ද?

(ආ) මෙම ප්‍රකාශය කාගේ ප්‍රකාශයක්ද?

VIII. (අ) එච්. එම්.කුඩලිගම මහතාගේ කාව්‍ය ග්‍රන්ථයක් නම් කරන්න.

(ආ) ඔහු හඳුන්වන අන්වර්ථ නාමය කුමක්ද?

IX. "තුමුල ගතින්දා

බාහු බෙලෙන්දා

වෙමි සේ තිදසින්දා

කුරිරු ගිජින්දා

කුඹු තල සින්දා

ලමි සේ කෙසරින්දා"

(අ) මෙම ප්‍රකාශය කාගේ ප්‍රකාශයක්ද?

(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් නාට්‍යය රචනා කළේ කවුද?.

X. (අ) සද්ධර්මරත්නාවලිය ග්‍රන්ථය රචනා කළේ කවුද?

(ආ) එය රචනා කිරීම සඳහා මූලාශ්‍ර කරගත් ග්‍රන්ථය කුමක්ද?

02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(I) සේ **රිවි බිම්බා** පතළ තෙද බලැති මහරු

මෙන රන් ටැම්බා නිසසල ගුණයෙන් සපිරු

මනරම් යුග බා දී අහස ඔසවන යුරු

**නෙ විකුම්** සිහ බා පෙරළුවේ ය ගල් පුවරු

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) මෙහි සඳහන් උපමා දෙකක් සරල භාෂාවෙන් ලියන්න.

(II) මහතෙරුන් හිඳ **සස්කළ** තන්හී පිළක් කළ හ. **මූඪගර්භ** වූ තිරිසන් ගතියැ සත්හු දු ඇරැ එහි හොවති. එ විගස මැ සුවයෙන් බර මුසිත්.දුරුබල ද ගෙනැ එන්නට නොහැකි ද අයට පිළ දෙව් දිය ඇරැ හිසැ ඔත් කළැ ඒ කෙණෙහිම බර මුසි."

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) මෙලෙස පිළක් සැකසීමට හේතුව කුමක්ද?

(II) එමා සත්හු වෙණ නඳ අසමානය
සමා නොවෙති කොවුලෝ උපමානය
තමා නාද මිහිරැයි යන මානය
දමා එයින් වින්දෝ අවමානය

(අ) මෙම කවියේ අර්ථය ලිහිල් බසින් ලියන්න.

(ආ) මෙම පැදි පෙළෙහි දැකිය හැකි ශබ්දාලංකාරයක් ලියන්න.

(IV) "උග්ගසේන නම් සිටු පුත්හු ද බුදුන් ඇතුළු නුවරට නොවඩනා තෙක්ම කෙළිලළු බලන්ට රැස් වූවන් කොක් සන් ගසන නියාවෙන් ඇඟිළි පෑ හිඟි කොටලා හුණ දඬු අඟ සිට ලා නික්ම සිස් අහස ම සත් විටක් පෙත්තක් මෙන් සිසැරි ලා බැස හුණ දඬු අග සිටියහ.

(අ) මෙහි දැක්වෙන උපමාවක් ලියන්න

(ආ) මෙම සිද්ධියට පසුව සිදු වූ දෙය කුමක්ද?

(V) "එතෙකිදු වුවත් ඒ ඒ රජුන් කෙරෙහි සිටි චර පුරුෂයෝ එක් සියයක් දෙන " කවුරු දනිද්ද කිම් දැයි බෝධි සත්වයන් වහන්සේට ආරක්ෂාව පිණිස කේවට්ටයා පිරිවරා සිට ගත්හ. බ්‍රහ්මදත්තයන් හා එක් සියයක් රජ දරුවෝ ධර්ම යුද්ධ මණ්ඩලයට ගියා හ.පුර දියවක යහපත් දවස් සඳ බලන්නට එක් සත් වැ එක දිශාව බල්නනවුන් පරිද්දෙන් පැඳුම් දිග බලා සිටියහ."

(අ) මෙහි සඳහන් පරිදි චර පුරුෂයන් කේවට්ට බමුණා පිරිවරා සිටගත්තේ ඇයි?

(ආ) ඉරි ඇදි කොටසේ අර්ථය ලිහිල් බසින් ලියන්න.

(ලකුණු 4X5 = 20)

(3). අඟුල්මල් දමනය කතා වස්තුව සාර්ථක වීමෙහි ලා කතුවරයා භාවිත කළ ,

I. චරිත නිරූපණය

II. භාෂා ශෛලිය

පිළිබඳව එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

(ලකුණු 15)

**නැතහොත්,**

හංස සංදේශයේ කතුවරයා

I අර්ථ රසය

II ශබ්ද රසය

මනා ලෙස සංකලනය කරමින් කාව්‍ය රචනා කළ ආකාරය එක් කරුණකට උදාහරණ දෙක බැගින් ඉදිරිපත් කරමින් සාකච්ඡා කරන්න.

(4). I අවස්ථා හා සිද්ධි නිරූපණයත්

II රසවත් ලෙස භාෂාව භාවිතයට ගැනීමත්

සිංහබාහු නාට්‍යයේ සාර්ථකත්වයට හේතු වූ ආකාරය එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් අදහස් ඉදිරිපත් කරන්න.

**නැතහොත්,**

දියමන්ති මාලය කෙටිකතාව රචනා කිරීමේදී ,

i. කෙටි කතා ලක්ෂණ අන්තර්ගත වීම

ii සජීවී චරිත නිරූපණය කතුවරයා භාවිතයට ගත් ආකාරය එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් සාකච්ඡා කරන්න.

- **5,6,7, ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.**

(5) වස්සානය පැදි පෙළ තුළින් අජීවී වස්තූන්ට සජීවීබව ආරෝපණය කිරීමට කවියා දැක්වූ දක්ෂතාවය උදාහරණ තුනක් ඉදිරිපත් කරමින් සාකච්ඡා කරන්න.

(6) අවස්ථා හා සිද්ධි නිරූපණයේදී කතුවරයා දක්වන ප්‍රතිභාව බැද්දේගම තුළින් මනාව නිරූපණය වන අයුරු උදාහරණ තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.

(7) යහපත් ජන ජීවිතයක් සඳහා ජන කවියෙන් ලබා ගත හැකි ආභාසය හානා හීය පානා අඩහැරෙන් දැනේ පැදි පෙළ ඇසුරින් උදාහරණ තුනක් දෙමින් විමසන්න.

(ලකුණු 10)